**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**සිංහල භාෂා අංශය**
**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය**

**11 ශ්‍රේණිය** **ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලේඛන**
**කාලය - පැය 02 යි.**

I කොටසෙහි (අ), (ආ), (ඉ) යටතේ ඇති මාතෘකාවලින් තෝරාගත් එක් මාතෘකාවකට රචනාවක් ද, II කොටසෙහි දී ඇති ප්‍රායෝගික ලේඛනවලින් තෝරාගත් එකකට ද පිළිතුරු ලියන්න.

## I කොටස

පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 350-400ට නොඅඩු වන සේ රචනයක් ලියන්න.

(අ) වර්තමාන ශ්‍රී ලංකාවේ මාර්ග පද්ධතිවල කඩිනම් සංවර්ධනයක් දක්නට ලැබේ. අධිවේගී මාර්ග තැනීම, අබලන් මාර්ග ප්‍රතිසංස්කරණය, මෙහි දී වැදගත් වේ. නමුත් දිනෙන් දින ඉහළ යන රිය අනතුරුවලට හේතුව මෙකී සංවර්ධනය බවට සමහරු මැසිවිලි නගති. එහෙත් ඇතැමුන්ගේ මතය අබලන් මාර්ග නිසා රිය අනතුරු සිදුවන බවයි. රියැදුරන්ගේ නොසැලකිලිමත්කම ඇතුළු බොහෝ දේ රිය අනතුරුවලට හේතු වෙයි. විනයගරුක රියැදුරන් බිහිකිරීමට අවශ්‍ය පියවර ගැනීම අත්‍යවශ්‍ය කරුණකි.

(ආ) ජාතික හා ජාත්‍යන්තර සමඟිය පිළිබඳ ව අද ලෝක ප්‍රජාවගේ අවධානය යොමු වී ඇත. ජාතික සමඟිය ඇති කිරීමේ මූලික පියවර වන්නේ පවුලේ සමඟිය ඇති කිරීමයි. නමුත් අද බොහෝ පවුල් තුළ පවා සමඟියක් ඇති බවක් නොපෙනේ.
දෙමව්පිය - දූදරු සබඳතා දුරස්ථ වී පවතී. තරඟකාරී සමාජ හා ආර්ථික රටාව තුළ එදා මෙන් දෙමව්පියන් හා දරුවන් අතර සුහදව කතා කිරීමේ අවස්ථාව ගිලිහී ඇත. ජාතික සමගිය කරා යන ගමනේ දී පවුලේ සමගිය රඳවා ගැනීම උදෙසා දෙමාපියන්ගේත් දරුවන්ගේත් කාර්යභාරය ඉතා විශාල ය.

(ඉ) කියවීම මිනිසා සම්පූර්ණත්වයට පත්කරන බව පිළිගැනීමයි. නූතන තාක්ෂණික දියුණුව සමඟ කියවීම කෙරෙහි පෙළඹීම බොහෝ අඩු වී ඇත.
භාෂා කුසලතා මෙන්ම රසඥතාව හීනවීමටත් මෙය බෙහෙවින් බලපා ඇත. එබැවින් කියවීම කෙරෙහි යොමු වීම හා යොමුකරවීම සඳහා පෙළඹවීමේ ක්‍රියාමාර්ග ඇරඹිය යුතුව ඇත.

## II කොටස

01. පසුගිය දිනක දී තිස්සපුර ප්‍රදේශයේ ඇති වූ අධික වර්ෂාව සහිත දැඩි සුළිසුළං තත්ත්වයක් හේතුකොට ගෙන නිවාස 150කට පමණ අලාභ හානි සිදු විය. මෙම තත්ත්වය හේතුවෙන් ප්‍රදේශවාසීන් ලක්ව ඇත්තේ දැඩි දුෂ්කරතාවයන්ට ය. ඒවා විස්තර කරමින් හැකි ඉක්මනින් සහාය සලස්වන ලෙස ඉල්ලා තිස්සපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමාජ සංවර්ධන නිලධාරීන් වෙත යැවෙන රාජකාරී ලිපිය ලියන්න. ඔබ තිස්සපුර ප්‍රදේශයේ "ප්‍රගති" සමාජ සේවා සංගමයේ ලේකම් පී.ආර්.සුනිල් අබේනායක ලෙස සලකන්න.

නැතහොත්

02. දසුන් අනුරාධපුර නගරයෙන් ඈත පිටිසර ගමක ජීවත් වූ දිළිඳු දරුවෙකි. ඔහු ඉගෙනුම ලැබුවේ ගමේ පිහිටි කුඩා පාසලෙනි. පාසලේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව පනහකට නොවැඩි විය. පහ ශ්‍රේණිය දක්වා පමණක් පන්ති පැවැත්වේ. ඉගෙනුමට මෙන් ම ක්‍රීඩාවට ද හපන්කම් පෑ දසුන් ශිෂ්‍යත්ව විභාගයට සුදානම් වන අතර ක්‍රීඩාවලට සහභාගී වූවේ ය. පසුගිය දා පැවති කොට්ඨාස හා කලාප තරගවලින් අතිවිශිෂ්ට ලෙස ජයගත් ඔහු වෙනුවෙන් පාසලේ උපහාර උළෙලක් සංවිධානය විණි. උත්සවයට සහභාගී වූ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා දසුන්ගේ දස්කම් බොහෝ අගයමින් දෙසුමක් පැවැත්වීය. මෙම විස්තරය ඇසුරින් පුවත්පතකට යැවෙන විශේෂාංග ලිපියක් සකස් කරන්න.

නැතහොත්

අ.පො.ස. සා.පෙළ විභාගයට පෙනී සිට ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින දරුවන් සඳහා වෘත්තීය පුහුණු පාඨමාලා කිහිපයක් ආරම්භ කිරීමට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය අපේක්ෂා කරයි. මේ සඳහා දීපව්‍යාප්තව සුදුසුකම් සපුරන ඕනෑ ම දරුවෙකුට සහභාගී විය හැකිය. තමාට ආසන්නතම මධ්‍යස්ථානය තෝරාගත හැකි ය.

- පුහුණු කාලය මාස තුනකි.
- සතියේ දිනවල පෙ.ව. 8.30-4.30 දක්වා පාඨමාලා පුහුණු වේ.
- ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා වැඩි ඉඩක් වෙන් වේ.
- පහත පාඨමාලා ආරම්භ වේ.

  -පරිගණක අලුත්වැඩියාව
  -සූපශාස්ත්‍රය
  -අත්කම් නිර්මාණ
  -ඇඳුම් මැසීම
  -බතික් කලාව

ඔබ මෙම වෘත්තීය පුහුණු අධිකාරියේ පුහුණු පාඨමාලා අංශභාර රුවන් ජයවර්ධන යැයි සිතා මෙම තොරතුරු ඇසුරින් සිසුන් දැනුවත් කිරීම සඳහා දැන්වීමක් සකස් කරන්න.